ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රවෘත්ති සංස්කාරක **2018 මැයි 21**

# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 අප්‍රේල්

### ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය අමර සතරසිංහ මහතා 2018 අප්‍රේල් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 1.6%ක් දක්වා අඩු වූ බව ප්‍රකාශ කලේය. පසුගිය මාර්තු මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 2.8%ක් ලෙස වාර්තා විය. තවද 2016 පෙබරවාරි මාසයේ සිට වාර්තාවූ අවම උද්ධමනය 1.6% වාර්තා වූයේ 2018 අප්‍රේල් මාසයේදීය. මෙම මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -0.2%ක හා ආහාර නොවන කාණ්ඩයේ 1.7%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 අප්‍රේල් මාසයේ 8.4% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.2%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 3.3%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 මාර්තු මාසයේ 122.8ක් වූ දර්ශකාංකය 2018 අප්‍රේල් මාසයේ 122.9ක් දක්වා ඉහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 අප්‍රේල් මාසයේ දර්ශකාංකය 0.1ක වැඩිවීමක් එනම් 0.1ක ප්‍රතිශතකාංක වැඩිවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.11%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.12%කින් වැඩිවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, ලොකුළූණු, පොල්, බිත්තර, කඩල, සහල් සහ අමු මිරිස් යන ආහාර ද්‍රව්‍යවල වියදම අඩුවීම බලපා ඇත. එසේ වුවත් දෙහි, අර්තාපල්, තේ කොළ, කෙසෙල්, කුකුල් මස්, අළුත් මාළු, වියළි මිරිස්, ළදරු කිරිපිටි, සහ රතුළූණු යන ආහාර ද්‍රව්‍යවල වියදම වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 අප්‍රේල් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවීම සඳහා 'මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය', 'රෙදිපිළි හා පාවහන්', 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', 'ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු' සහ 'ප්‍රවාහන' යන කාණ්ඩවලට අයත් සමහර අයිතමයන්ගේ මිල වැඩිවීම බලපා ඇත. 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන' කාණ්ඩයේ වියදම් වල වටිනාකම වැඩිවීම සඳහා 2018 අප්‍රේල් 28 සිට LP ගෑස් මිල ඉහළ දැමීම හේතු විය. 'ප්‍රවාහන' කාණ්ඩයේ වියදම් වල වටිනාකම වැඩිවීම සඳහා 2018 මාර්තු සිට ඉන්ධන මිල ඉහළ දැමීම හේතු විය. පසුගිය මාසය හා සසඳන විට 'විවිධ භාණ්ඩ හා සේවා' කාණ්ඩයේ සමහර අයිතමයන්ගේ ඉතා සුළු මිල වැඩිවීමක් වාර්තා විය. මෙම මස තුළ 'සෞඛ්‍ය', 'සන්නිවේදන', 'විනෝදාත්මක හා සංස්කෘතික', 'අධ්‍යාපන' සහ 'ආපනශාලා සහ හෝටල්' යන කාණ්ඩවලට අයත් කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවීය.




ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | අප්‍රේල් | 121.0 | 1.3 | 8.4 |
| | මැයි | 121.8 | 0.7 | 7.1 |
| | ජූනි | 123.4 | 1.3 | 6.3 |
| | ජූලි | 122.4 | -0.8 | 6.3 |
| | අගෝස්තු | 122.3 | -0.1 | 7.9 |
| | සැප්තැම්බර් | 123.3 | 0.8 | 8.6 |
| | ඔක්තෝම්බර් | 124.8 | 1.2 | 8.8 |
| | නොවැම්බර් | 126.4 | 1.3 | 8.4 |
| | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |